15 පාඩම

# දැතේ කරගැට සිඹ සනසන්නට.

මහගමසේකර මහතා (1929 - 1976 )

( නූතන පද්‍යය )

# මහගමගේ සමරසේකර (මහගමසේකර) මහතාගේ ජීවන තොරතුරු

- 01 . උපන් ස්ථානය :- සියනෑ කෝරලයේ කිරිඳිවැල නගරයට ආසන්න රදාවාන ගමේදී
- 02 . උපන් දිනය :- 1929 අප්‍රේල් 07
- 03 . මරණය සිදු වූ දිනය :- 1976 ජනවාරි 10
- 04 . අධ්‍යාපනය ලැබූ ආයතනය :-
- රදාවාන රජයේ පාසල,
- කිරිඳිවැල රජයේ මිශ්‍ර පාසල,
- රජයේ ලලිත කලා ආයතනය,
- නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලය,
- ලන්ඩන් විශ්වවිද්‍යාලය ( ශාස්ත්‍රවේදී බාහිර උපාධිය )
- විද්‍යෝදය විශ්වවිද්‍යාලය.

# මහගමසේකර මහතා යෙදී සිටින වෘත්තීන්

- රාජගිරිය හේවාවිතාරණ විද්‍යාලයේ චිත්‍රකර්ම ආචාර්ය.
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන් සම්පාදක
- මීරිගම ගුරු විද්‍යාලයේ චිත්‍රකර්ම කථිකාචාර්ය
- රජයේ ලලිත කලායතනයේ විදුහල්පති
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ඒකක ප්‍රධාන තනතුර
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය
- පුවත්පත් කලාවේදියෙක් ලෙස ද සේවය කළේය.

මහගමසේකර මහතා විවිධ අංශවලින් නිර්මාණකරණයෙහිලා දස්කම් දැක්වූයේය.

- කාව්‍ය
- ගීත
- නාටක
- නවකතා
- කෙටිකතා
- සිනමාව
- චිත්‍ර කලාව
- පුවත්පත් කලාව

- ගැමි පරිසරයේ හැදී වැඩෙමින් ජීවිත තක්ෂලාවෙන් ලත් අත්දැකීම් තම නිර්මාණ සදහා අත්දැකීම් කරගත් සේකරයන් ගේ කාව්‍ය හා ගී පද රචනාවන්හි ජන ගී සම්ප්‍රදාය සහ සම්භාව්‍ය සාහිත්‍යය ද මිශ්‍ර වී තිබේ.

# සේකරගේ සාහිත්‍ය කලා නිර්මාණ :-

- සර් ආතර් කොනන්ඩොයිල්ගේ " THE WHITE COMPANY" නව කතාව "ධවල සේනාංකය " නමින් සිංහලයට පරිවර්ථනය කරමින් සාහිත්‍යකරණයට පිවිසෙයි.
- ඉන්දීය කිවිඳියක වන ' සරෝජිනී නායිදු ',ගේ ''INDIAN WEAVERS'' ඇසුරෙන් සන්නාලියනේ ගීතය,
- රබීන්ද්‍රනාත් තාගෝර් ගේ රචනයක් ඇසුරෙන්, ' පටු අදහස් නම් පවුරින් ලෝකය 'ගීතය
- ඛලීල් ජබ්රාන් ගේ ' මුළු ලොව ම සිහිනයයි ' ගීතය,
- ඕමාර් ඛයියාම්ගේ 'රුබයියාට් ද,
- ග්‍රීක නාට්‍යයක් වන 'ඊඩිපස් නාට්‍යය ද ඔහු අතින් පරිවර්ථනය වෙයි.

# මහගමසේකර මහතාගේ කලා නිර්මාණ

## ගුවන්විදුලි නාට්‍යය

- කුණ්ඩලකේසී නාට්‍යය
- ස්වර්ණතිලකා

## පරිවර්තන නාට්‍යය

- ගැහැනු ඉස්කෝලේ -THE SCHOOL OF WIVES

# ළමා සාහිත්‍යය

- පුංචි අපට කයි කතන්දර - 1958
- සරු පොළවක් අපට ඇතේ - 1973
- කොටි වලිගය - 1990
- ගී සීපද

# නාට්‍ය හා නාට්‍ය ගීත

- සද්දන්ත හා තවත් කතා - 1961
- මුහුදු පුත්තු නාට්‍ය (ගුණසේන ගලප්පත්ති සමඟ) මූදු පතුල යට ඉදලා ගීතය,
- චිත්‍රසේනගේ නලදමයන්ති මුද්‍රා නාටකයේ 'ඇත කඳුකරහිමව් අරණේ' ගීතය.

# නවකතා

- තුංමංහන්දිය - 1967 ( මෙම නවකතාව සිනමාවට නගන ඔහු **සිනමා අධ්‍යක්ෂකවරයෙක්** බවට ද පත්වෙයි )

- මනෝමන්දිර - 1971

# කෙටිකතා හා ගීත රචනා

- කෙටිකතා - මහගමසේකර කෙටිකතා හා චිත්‍ර
- ගීත රචනා -

  මහගමසේකරගේ ගීත - 1972

  මහගමසේකර නොපළ ගීත

# ශාස්ත්‍රීය ග්‍රන්ථ

❖ සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ

සේකරයන්ගේ ප්‍රබුද්ධ ඇතුළු නිර්මාණ කිහිපයක්ම ප්‍රකාශයට පත් වන්නේ ඔහු මිය යෑමෙන් පසුවය. මෙම ග්‍රන්ථය ද මිය යෑමේ පසුව පල වූ අතර ඒ සඳහා ශ්‍රී ජයවර්ධන විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය පිරි නැමුණි. මිය ගිය අයෙකු සඳහා ආචාර්ය උපාධිය පිරිනැමූ ප්‍රථම අවස්ථාවද එය වේ

# කාව්‍ය ග්‍රන්ථ

- වැංගා ( කේ.ජයතිලක සමග ) - 1960
- සක්වාලිහිණි - 1962
- නොමියෙමි - 1973
- ප්‍රබුද්ධ - 1977
- හෙට ඉරක් පායයි - 1963
- මක් නිසාද යත් - 1964
- රාජතිලක. ලයනල් හා ප්‍රියන්ත - 1967
- බෝඩිම - 1970

# මහගමසේකරයන්ගේ ජනප්‍රිය ගීත

- රත්නදීප ජන්මභූමි
- ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන
- පාලු අඳුරු නිල් අහස මමයි
- ආරිච්චි බොරිච්චි
- සිනිඳු සුදු මුදු තලාවේ
- අන්න බලන් සඳ
- ඈත කඳුකර හිමව් අරණේ
- මූදූ පතුල යට ඉඳලා

## පාඩම උපුටා ගත් ග්‍රන්ථය

**ප්‍රබුද්ධ** කාව්‍ය ග්‍රන්ථය

( මහගමසේකරයන්ගේ නොපළගීත කෘතියේ ‘ප්‍රාර්ථනා නමින් ද මෙය පළවී ඇත.)

# සංගීතය හා ගායනය

- ඩබ්.ඩී.අමරදේව ශූරීන් විසින් සංගීතවත් කොට විමලා අමරදේව සමඟ ගායනා කරයි.

- මෙමගින් දේශයේ අතීත ශ්‍රී විභූතිය , ජාතිකාභිමානය, ශ්‍රමාභිමානය යන සංකල්ප ජනිත කෙරෙන අතර සමෘද්ධිමත් හෙට දිනක් පිළිබඳ අනාගත අපේක්ෂා දල්වන විශිෂ්ට නිර්මාණයකි.

# 01. දෑතේ කරගැට සිඹ සනසන්නට
# ළා ගොයමේ දළු පවන් සලයි
# දහදිය මුතු ඇට මල් වරුසා වී
# කරල් බරින් පීදී වැගිරෙයි

මෙම කවියෙන් කියැවෙන්නේ , ජාතියට බත සපයන ගොවියා පිළිබඳවයි. ඔහුගේ අත්දෙකෙහි කරගැට ආවේ උදැල්ල හා නඟුල සමග පොර බදිමින් සරු අස්වැන්නක් ලබා ගැනීමට ගත් උත්සාහය නිසයි. ඔහු ගේ දෑත්වල කරගැට වලින් නැගෙන දැවිල්ල පිස දැමීමට ළපටි ගොයමෙන් එන සිසිල් පවන සහාය වෙයි. කවියා පෙන්වා දෙන්නේ ගොවියා ගේ දුක් ගිනි නිවීමට වෙන කවරකු හෝ නොව ඔහු විසින් වගා කළ ගොයම් පැළ මතින් හමා එන මද පවන උපකාර බවයි.

මෙහි මුල් පද දෙකෙන් උත්ප්‍රේක්ෂාලංකාරය මතු වේ . ( උත්ප්‍රේක්ෂාලංකාරය යනු ස්වභාවයෙන් පවත්නා යම් වස්තුවක් අන්‍යාකාරයෙන් දැක්වීමයි) මුතු ඇට යනු වටිනා සම්පතකි. ගොවියාගේ දහදියට ඉතා වටිනාකමක් ලැබී තිබේ. එම වටිනාකම ලබා දෙන්නේ අස්වනු සාරවත් කරමිනි. කරල් බර වී ඇත්තේ ගොයමේ සරුසාරවත් බව නිසයි. දහදිය මුතු ඇට සේම මල් වරුසාවක් ද වන්නේය. මේ ගොවියාගේ ශ්‍රමයට ලබාදුන් මහඟු වටිනාකමකි.

දහදිය මුතු ඇට . මල් වරුසා වී යනු රූපකයන් ය.

සිව්පද ආකෘතියකි. එහෙත් එළිසමය නැත.

ගී විරිතෙන් රචනා කොට ඇත.

02\. අඩ සඳ මෝරන මැදියම් අහසින්
බිලිඳු හදට කිරි දියර ගලයි
හෙට ඉදි වන නව ලෝකය දැක දැක
පුංචි පුතා හීනෙන් හිනැහෙයි

මධ්‍යම රාත්‍රිය උදා වී ඇත. අහසේ සඳ මෝරමින් පවතී. සඳෙන් කිරි වතුර ගලා විත් බාල බිළිඳුගේ හද තෙමාලයි.හද මෘදු කරුණා දයා ගුණයෙන් පුරවාලයි. නිහඬ ,නිසල මැදියම් රාත්‍රියේ පුතු තද නින්දේය. පුංචි පුතු නින්දෙන් සිනහා වෙන්නේ හෙට ඉදි වන නව ලෝකය සිහිනයෙන් දකිමිනි. මේ කවියාගේ අරමුණයි. එනම් හෙටම ( ළඟදීම ) අදට වඩා යහපත් යුගයක් පුංචි පුතා ට ( අනාගතය ) ඉදිකරදීමටයි. මෙහි මුල් පද දෙකෙන් දාරක ප්‍රේමය ඉස්මතු වේ.මෙහිදී කවියා පියෙකු වූ ගොවියාගේ කායික ශක්තිය වැය කරන්නේ තම පුතු වෙනුවෙන් බව ද සංකේතවත් කරයි. හෙට ඉදිවන නව ලෝකය දැක පුංචි පුතා හීනෙන් හිනැහුණේ වර්තමාන වැඩිහිටි පරපුර තමුන්ගේ අනාගතය වෙනුවෙන් ලෝකය ඉදිකරනු දැකීමෙනි.

මුල්පද තුනම ලේඛන ව්‍යවහාරයෙන් ලියා ඇත. අවසාන පදය සරල පද මාලාවකින් ලියා ඇත. මුල් පද දෙකෙන් උත්ප්‍රේක්ෂාලංකාරය ඇති කිරීමට කවියා සමත් වී ඇත. ‘දැක දැක යනුවෙන් අනුප්‍රාසවත් යෙදුම් ද භාවිතා කරමින් රසවත් පද මාලාවක් තුළින් රසිකයාගේ සිත් ආනන්දවත් කරයි.

# 03. දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
# යළි ඉපදී ඇති මව් දෙරණේ
# සත් රුවනින් නව නිදහන් මතු වී
# පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ

අතීතයේ අපේ රටේ විසූ රාජ්‍ය පාලකයෝ තම පාලන කාලය තුළ වැවක් බැඳීම තම ප්‍රධාන වගකීමක් මෙන්ම යුතුකමක් ලෙසද සැලකූහ. මහා පරාක්‍රම සමුද්‍රය, කලා වැව, තිසා වැව, යෝධ ඇල ආදි ලෙස දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැලක් අතීතයේ විසූහ. සමහර ප්‍රදේශ වැව් බැඳි රට, ලෙසින් හැඳින්වීය. මින්නේරි වැව දුටු ‘ හෙන්රි වෝඩ් ආණ්ඩුකාරයා එය ජලාශයක් නොව සයුරක් බව කීවේය. යෝධ ඇලේ බැස්ම සැතපුම් හයකට අඟලකි. මෙවන් විශ්වකර්ම කළෝ යෝධයෝ නොවන්නෝද ? ඒ අයුරින් දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල යළි ඉපදී ඇති බව කවියා ප්‍රකාශ කරන්නේ ආඩම්බරයෙනි. ඉතා භාවාත්මක පද මාලාවකි. දරුවන්ගේ අනාගතය සරු කරන්න අද කරන කැප කිරීම කවියා අපර්ව පද සංඝට්ටාවක් තුළින් ධ්වනිතාර්ථවත් කරයි.

සත් රුවනින් නව නිදහන් මතු වී ඇත්තේ පුතා වෙනුවෙනි. රුවන් යනු මැණික් ය. මැණික් හතක්ම මතු වී ඇත්තේ දරුවන්ගේ අනාගත සෞභාග්‍ය උදා කිරීමට ගොවියා කරන මහා කැප කිරීමේ ප්‍රතිඵලයන් තුළිනි. එම කැප කිරීම් කරන්නේ දරුවන් වෙනුවෙනි. දරුවන් මැණික් සේ ගුණ යහපත් කමින් ඔප වැටුණු අය විය යුතුය. පුතා ගේ සිනාවෙන් ඒ මැණික් ඔප වැටී ඇතැයි කවියා ගෙනහැර දක්වන්නේ එබැවිණි.

## 04. දෑසේ කඳුළැලි පිස දා බලනෙමි
## හෙට හිරු එළියට වඩින දිනේ
## ණය නැති බිය නැති නිවහල් යුගයක
## පුංචි පුතා රජ කරනු පෙනේ

දෑස් පිසදා බලන්නේ හෙට හිරු පායන තුරුය. මෙයින් රසිකයාට හැඟෙන්නේ අතීතය පිළිබඳ කණස්සලු ස්වභාවයකි. අතීතය ද වර්තමානය ද ණය බරින් ජීවත් වීමට සිදුවීම කණගාටුවකි. ඒ ණය අනාගත පරපුරට දායාද කළ නොහැකිය. ඒ නිසාම ඔහු අද බොහෝ වෙහෙසෙයි. අතිශය භාවාත්මක පද මාලාවක් තුළින් සහෘදයා ශ්‍රමය වපුරන ජනයා කෙරෙහි ආසක්ත කරන්නේ ප්‍රබල ධ්වනිතාර්ථ මතු කරමිනි. කවියාගේ බලාපොරොත්තුව ණය නැති බිය නැති දේශයක තම පුතු රජ කරවීමයි. ඒ වෙනුවෙන් ඔහු දහදිය හෙළුවේය. ඔහුගේ ප්‍රාර්ථනා ලෝකය ඈතක නොවේ. හෙටම යනු ඉක්මනින්ම නුදුරේම යන්න ධ්වනිතාර්ථවත් කරයි. හිරු තුළින් තේජස ඇති කරයි. සේකරයන් උත්සාය කළේ කාටවත් ණය නැති, එනම් සංවර්ධිත නිවහල් දේශයක් අනාගත පරපුරට දායාද කිරීමට කෘෂිකාර්මික දියුණුව තුළින් හැකිවේය යන බලාපොරොත්තුවයි.

05. මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත සාදන පුංචි පුතුන්
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට.
ඔබ සිහිවන විට පුංචි පුතුන්

- අනාගත පුරපුරට සංවර්ධිත, නිදහස් දේශයක් බිහි කරදීම වර්තමාන වැඩිහිටි පරපුරේ වගකීමයි. වගකීමටත් එහා ගිය යුතුකමක් සේ කවියා දකියි. මෙම ගමනේ දී බොහෝ වෙහෙස මහන්සි විය යුතුය. එහෙත් ඒ වෙහෙස නිවෙන්නේ දරුවන්ගේ ආදරය නමැති දිය උල්පත තුළිනි. දිය කඩිත්තක් නොවේ. නොකඩවා ගලන දිය උල්පතකි. මෙමගින් කවියා ධවනිථාර්තවත් කරන්නේ දරුවන්ට පාන සෙනෙහස නිමාවක් නොවන බවයි. මෙය මානව සිත්හි සදාතනික ධර්මතාවකි. දෙමව්පියෝ තම දරුවන් වෙනුවෙන් වෙහෙසෙයි. කොතරම් විඩා දැනුන ද දරුවන්ගේ සිනාව දුටු විට විඩාව නිවේ. ඒ ශාරීරික වේදනාවම සතුටක් වන්නේ පුංචි පුතුන් සිහිවන විටදිය.
- ‘ ආදරයේ දිය උල්පත ’ ප්‍රබල රූපකයකි.

06 “ දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදිකර දී මිස
යා නොහැකිය මට පුංචි පුතුන් ”

කවියා පවසන ආකාරයට මීට වසර දෙදහස් පන්සිය වසරක් තිස්සේම එක්තරා සිහිනයක් තිබිණි. එනම් දේශයේ අනාගතය වූ බාල පරපුරට ප්‍රාර්ථනා කළ ලෝකය ඉදිකර දීමයි. ඒ ලෝකය ඉදිකර දී මිස මිය යා නොහැකි බව කවියා කියයි. සියවස් ගණනාවක් තිස්සේ තිබූ ප්‍රාර්ථනාව තවමත් ඉටු නොවූ බව පළමු පද දෙකෙන් ධ්වනිත වේ. එහෙත් ළඟදීම ප්‍රාර්ථනා කළ ලෝකය ඉදිවනු ඇත. එතෙක් මිය යා නොහැකි බව කවියා පෙන්වා දෙයි.

නිසඟ කවීත්වය තුළින් ශ්‍රමාභිමානි හැඟීම් ජනිත කරමින් ජාතිය නගා සිටුවීමට අවශ්‍ය පන්නරය ඇති කරන දේශාභිමානය රසික සිත් තුළ රෝපණය කරන සාර්ථක පද්‍ය පන්තියක් ලෙස මහගමසේකරයන්ගේ “දෑතේ කරගැට සිඹ සනසන්නට....,, පද්‍ය පන්තිය සැළකිය හැකිය. ධ්වනිතාර්ථවත් පද මාලාව, රූපකාලංකාර , උත්ප්‍රේක්ෂකාලංකාර ,අනුප්‍රාසවත් යෙදුම් හා ගීතවත් බව තුළින් සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාවට කැදවාලු සාර්ථක පද්‍ය පන්තියකි.

සැකසුම :-

ඩබ්.එස්.වී.කේ විජයසිරි

කෑ/හකහින්න මහා විද්‍යාලය